# රට තුළ සුනාමි වළක්වාගනිමු!

ඔවුන් අවධාරණය කළේ මෙරට වේලි හා ජලාශවල නඩත්තුවට නිසි අවධානය හා සම්පත් යොමුවී නැති බවත්, මේ නිසා අනාගතයේ දිනයෙක රට තුළ අභ්‍යන්තර සුනාමි හට ගැනීමේ සැබෑ අනතුරක් තිබෙන බවත්.




සිවු මංසල කොලුගැටයා

නාලක ගුණවර්ධන <ravaya@nalaka.org>

මානවයන් සොබා දහමත් එක්ක ගනුදෙනු කිරීම බොහෝ කාලයක් තිස්සේ කර ගෙන එන දෙයක්. පැහැදිලිව අපේ වර්ගයා සොබාදහම වෙනස් කරන්නට ගත්තේ මීට අවුරුදු දස දහසකටත් පෙර ගොවිතැන් කරන්නට පටන් ගැනීමත් සමගයි. මුලදී වැසි දියෙන් පමණක් වගා කළත් පසුව වියළි කාලයටත් පාවිච්චි කරන්නට ජලය ගබඩා කර තබා ගන්නට ආදි ශිෂ්ටාචාර ගණනාවක් ම පෙළඹුණා.

ගලා යන ගංගා හරස් කර වේලි බැඳීම වගේ ම වැව් හා ජලාශ තනා වැසි ජලය එක් රැස් කර ගැනීමේ වසර 3,000ක පමණ අත්දැකීම් ශ්‍රී ලංකාවේ අපට තිබෙනවා. වාරිකර්මාන්ත මත පදනම් වූ අපේ ශිෂ්ටාචාරය ගැන අප කථා කරන්නේ මහත් ආඩම්බරයෙන්.

ජලය රැස්කිරීම හා හැසිරවීම බොහෝ සීරුවෙන් කළ යුතු දෙයක් බව පැරණි ලාංකිකයෝ වගේ ම අද දවසේ වාරි ඉංජිනේරුවොත් හොඳාකාර දන්නවා. මනා සේ කැරෙන ජලසම්පත් පාලනයෙන් ගොවිතැන්වලට පමණක් නොවෙයි. විදුලිබල ජනනය, ගංවතුර පාලනය මෙන් ම අභ්‍යන්තර ප්‍රවාහනය හා මිරිදිය මසුන් ඇති කිරීම වැනි අතුරු ප්‍රයෝජනත් ලද හැකියි. එහෙත් එක් රැස් කර ගත් ජලය අපේ පාලනයෙන් මිදුණොත් ආපදා ඇති කරන බවත් අප අත්දැකීමෙන් ම දන්නවා.

ජනවාරි හා පෙබරවාරි මාස දෙක තුළ ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලට ලැබුණු අධික වැසි නිසා ගංවතුර හටගත්තා පමණක් නොවෙයි, වැව් හා ජලාශ රැසක ධාරිතාව ඉක්මවා ගියා. වැව් බැමි 200 කට වැඩි ගණනක් මේ නිසා හානියට පත් වුණා. මෙයට වැඩිපුර ම හේතුවූයේ බලාපොරොත්තු නොවූ තරමේ වැසි/ගංවතුර පරිමාවක් ඉතා කෙටි කාල පරාසයක් තුළ එම වැව් හා ජලාශවල එකතු වීමයි.

ඕනෑ ම වාරිකර්මාන්තයක් සැලසුම් කරද්දී සැලකිල්ලට ගන්නා උපරිම ධාරිතාවක් තිබෙනවා. එහෙත් දැන් මේ සමහර ගණනය කිරීම් යළි සලකා බලන්නට සිදුවන බවයි ඒ පිළිබඳ විශේෂඥයන්ගේ අදහස. දේශගුණික විපර්යාස නිසා පෙර නොතිබූ තරම් ආන්තික කාලගුණ තත්ත්වයන් හටගන්නා බවට පසුගිය සති කිහිපයේ අත්දැකීම් නිසා දැන් තේරුම් ගෙන තිබෙනවා.

වාරිමාර්ග පද්ධතිය භාරව සිටින ඉංජිනේරුවන් හා නිලධාරීන්ගේ කඩිනම් ප්‍රතිචාර නිසා, විය හැකිව තිබූ වඩාත් විශාල ව්‍යසනයන් වැළැක්වුණු බවට අපට අනුමාන කළ හැකියි. එහෙත් මේ සියල්ල අපට නැවතත් මතක් කර දුන්නේ අපේ රටේ වැව්, ජලාශ හා ඇළ මාර්ගවල නඩත්තු කිරීම හා කාලීනව පිළිසකර කිරීම ජාතික අවශ්‍යතාවක් බවයි.

මේ පිළිබඳව දැඩි අවධානය යොමු කරන බවට වාරිමාර්ග දෙපාර්තමේන්තුවත්, වාරිමාර්ග හා ජලසම්පත් අමාත්‍යාංශයත් පෙබරවාරිය මුලදී ප්‍රකාශ කළා. 2008 සිට ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් ව්‍යාපෘතිය වඩාත් පුළුල් කරන බවත්, ඒ සඳහා ලෝක බැංකුවෙන් දැනට ලැබෙන ණය මුදලට අමතරව වැඩිපුර ප්‍රතිපාදන ලබා ගන්නට බලාපොරොත්තු වන බවත් නිලධාරීන් කියා සිටියා.

ඇත්තට ම ශ්‍රී ලංකාවට වාරිකර්මාන්ත නඩත්තු කිරීමේදී විශාල අභියෝගයක් තිබෙනවා. රටේ බිම් ප්‍රමාණයක් සමග සසඳන විට අපට තිබෙන අභ්‍යන්තර ජලාශ හා ඒවාට අනුයුක්ත ඇළ මාර්ග පද්ධතිය ප්‍රමාණාත්මකව ඉහළයි. රජ කාලේ නිර්මාණය කළ වැව් අමුණුවලට අමතරව පසුගිය දශක කිහිපය තුළ ඉදි කළ ජලාශ ගණනාවක් ද තිබෙනවා. විශාල හා මධ්‍යම ප්‍රමාණයේ වේලි 350ක් හා කුඩා වේලි 12,000ක් අපේ ජල සම්පත් පාලනයට යොදා ගන්නවා.

මේවායේ නඩත්තු කිරීම හා පරිපාලන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය ආයතන කිහිපයක් අතර බෙදී තිබෙනවා. වාරිමාර්ග දෙපාර්තමේන්තුව ප්‍රධාන පෙළේ ජලාශ හා වාරිකර්මාන්ත භාරව සිටින අතරේ, කුඩා වැව් පිළිබඳ වගකීම ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට පැවරී තිබෙනවා. මීට අමතරව මහවැලි අධිකාරිය, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා විදුලිබල මණ්ඩලය යටතේ පාලනය වන ජලාශයන් තිබෙනවා. ඒ වගේ ම මේ රටේ සමහරක් වේලි මහාමාර්ග හෝ දුම්රිය ගමනාගමනයටත් සමහර තැන්වලදී යොදා ගන්නවා.

මේ බහුවිධ ආයතනික රටාව තුළ වේලි හා ජලාශවල මනා නඩත්තුව පිළිබඳ අවශ්‍ය තරම් සම්බන්ධීකරණයක් සිදුවන්නේ නැහැ. ඒ වගේ ම අධික වර්ෂාව ඇති විටක හෝ වෙනත් හදිසි අවස්ථාවකදී මහජන ආරක්ෂාව සඳහා ඉක්මනින් තීරණ ගැනීමටත් සමහර විට මේ තත්ත්වය බාධාවක් විය හැකියි. අනතුරු හා ආපදා සමහරක් වළක්වා ගැනීමේ ඉඩකඩ මේ නිසා ඇහිරෙනවා.

2004 දෙසැම්බරයේ සුනාමිය ගැන පසු විපරම් කරද්දී සොයා ගත් හැටියට, එම ආපදාව ගැන ජාත්‍යන්තර අනතුරු ඇඟවීම ශ්‍රී ලංකාවේ බලධාරීන්ට ලැබුණා. ඒත්, රට තුළ ඒ තොරතුර නිසි කලට බෙදාහැරුණේ නැහැ. එයින් සිදු වූ ජීවිත හානිය ඉතා විශාලයි. සුනාමියෙන් පසු තවත් මෙබඳු ආපදාවන් ගැන අපේ විද්වතුන් හා ජන සංවිධාන අවධානය යොමු කළා. ඒ එක් ගවේෂණයක්, වේලි හා ජලාශවල ආරක්ෂාවට සම්බන්ධයි. මෙරට වාරිමාර්ග ඉංජිනේරුවන් පෙරටු කර ගෙන මේ ගවේෂණය කළේ ලර්න්ඒෂියා (LIRNEasia) පර්යේෂණ ආයතනය හා මාධ්‍ය ආයතනයකට අනුයුක්ත වැන්ගාඩ් පදනමයි (Vanguard Foundation). ඔවුන් විද්‍යාඥයන් හා නිලධාරීන් මෙන් ම වේලි හා ජලාශ ආශ්‍රිතව වෙසෙන සාමාන්‍ය ජනතාවත් හමුවී අදහස් විමසුවා. සර්වෝදය හරහා පොළොන්නරුව, මහනුවර හා ගම්පොළ ප්‍රදේශවල රැස්වීම් පැවැත්වූවා. විද්වත් හමුවක් කොළඹදී පැවැත්වුණා.

මේ සියල්ලේ සම්පිණ්ඩිත වාර්තාව ඔවුන් 2006 ජනවාරියේ නිකුත් කළා. (http://tiny.cc/DamSafe බලන්න.) එයින් ඔවුන් අවධාරණය කළේ මෙරට වේලි හා ජලාශවල නඩත්තුවට නිසි අවධානය හා සම්පත් යොමුවී නැති බවත්, මේ නිසා අනාගතයේ දිනයෙක රට තුළ අභ්‍යන්තර සුනාමි හට ගැනීමේ සැබෑ අනතුරක් තිබෙන බවත්. ජනසංවිධාන, විද්වතුන් හා ජනමාධ්‍ය සමහරක් එකතු වී මෙසේ පර්යේෂණාත්මකව ඉදිරිපත් කළ මේ අනතුරු ඇඟවීම හා එයට අදාළ නිර්දේශ රජයේ අවධානයට ලක්වුණා. 2008 වසරේ ලෝක බැංකුවේ ඩොලර් මිලියන 65.3ක සහන ණයක් ලබාගෙන ශ්‍රී ලංකා වේලි ආරක්ෂණ හා ජලසම්පත් සැලසුම් ව්‍යාපෘතිය ඇරඹීමට එය දායක වුණා.

කිසිම වේල්ලක් හෝ ජලාශයක් සදාකාලිකව පවතින්නේ නැහැ. නමුත් නිසි කලට නඩත්තු කිරීමෙන් ඒවා දශක ගණනක් වැඩට ගත හැකියි. නඩත්තු කිරීමේ හදිසි අවශ්‍යතාව ඇති විශාල වේලි 80ක් අතරින් 32ක් පිළිසකර කිරීමට මේ ව්‍යාපෘතිය පියවර ගන්නවා. එයට පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය වැව, තිසා වැව, කන්තලේ වැව වැනි පැරණි වැව් වගේ ම වික්ටෝරියා, කොත්මලේ හා රන්දෙනිගල වැනි මහවැලි ජලාශත් අයිතියි. (වැඩි විස්තර සඳහා www.damsafety.lk වෙබ් අඩවිය බලන්න.)

කන්තලේ වැවේ වේල්ල බිඳී ගියේ 1986 අප්‍රේල් මාසයේ 20 වන දා. එයින් 127 දෙනකු මිය ගියා. දස දහසකට අධික සංඛ්‍යාවක් පීඩාවට පත් වුණා. ඒ පිළිබඳ කරුණු සොයා බැලූ කොමිසම තීරණය කළේ, කල්ගත වීම නිසා දුර්වලව තිබුණු එක් සොරොව්වක්, නොසැලකිලිමත් මිනිස් ක්‍රියාකාරකම් නිසා පිපිරී කන්තලේ විනාශය සිදු කළ බවයි. කන්තලේ වැව් බැම්ම බිඳී යාම පාර්ලිමේන්තුවේත්, විද්වත් සභාවලත්, ජනමාධ්‍යවලත් දැඩි විවාදයට ලක් වුණා. විද්‍යා සන්නිවේදනයට මා යොමු වූ මුල් කාලයේ මේ පිළිබඳ විද්වත් මතවාදයන් වාර්තා කළ හැටි මට හොඳින් මතකයි. කන්තලේ ඛේදවාචකය වළක්වා ගත හැකිව තිබූ බවයි මැදහත් විද්වතුන්ගේ මතය වූයේ.

අද අපට ඇති අභියෝගය කන්තලේ බඳු ව්‍යසනයන් එකක් නොවෙයි දුසිම් ගණනක් ඇතිවීම කෙසේ වළක්වා ගත හැකිද යන්නයි. අතීත වාරි හපන්කම් ගැන ආඩම්බරවීම පමණක් මදි. එදා මෙදා මෙරට ඉදි කර ඇති වේලි හා ජලාශ නිසි කලට නඩත්තු කරන්නටත්, විද්වතුන් මෙන්ම ජලාශ ආශ්‍රිතව වෙසෙන ජනතාවගේ අදහස්වලට හොඳින් සවන් දීමටත් අවශ්‍යයි. එය, කන්තලේ ව්‍යසනයට වසර 25 ක් පිරෙන මේ වසරේ අපට ගතහැකි හොඳ ම ඉදිරිගාමී පියවරක්. ■